# ලංසු සඳහා ආරාධනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ආරක්ෂක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා යුධ හමුදාවේ සෙසු නිලයන්ගේ භාවිතය සඳහා ධාවන / ක්‍රීඩා පාවහන් යුගල 167,000 ක් ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය : MOD/SLA/01/2021**

01. ශ්‍රී ලංකා යුධ හමුදව වෙනුවෙන් කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා යුධ හමුදව වෙත සෙසු නිල ධාවන ක්‍රීඩා පාවහන් යුගල 167,000 ක් මිලදී ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය අනුව සිදු කරනු ලැබේ.

03. කොන්ත්‍රාත්තුව ප්‍රදනය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, අවසන් වසර දෙක (02) තුළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මගින් සනාථ කරන ලද රු. මිලියන 300 ක අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම සපුරාලිය යුතුය. තවද ලංසුකරු සතුව පසුගිය වසර තුන (3) තුළ රජයේ හෝ වෙනයම් සංවිධානයකට ධාවන / ක්‍රීඩා පාවහන් යුගල අවම වශයෙන් 50,000 ක් සැපයීමේ පළපුරුද්ද තිබිය යුතුය.

04. අභිලාෂී ලංසුකරුවන්හට ශ්‍රී ලංකාවේ කොළඹ ශ්‍රී ජයවර්ධනපුර, යුධ හමුද මූලස්ථානයේ යුධෝපකරණ මාස්ටර් ජනරාල් ශාඛාව වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය. දු.ක. 0094-11-2432135, විද්‍යුත් තැපැල : mgobranchemail@gmail.com පහත සඳහන් ලිපිනයේදී 2021.08.09 වන දින සිට 2021.08.30 වන දින දක්වා සෑම රාජකාරි දිනකම 9.00 පැයත් 15.00 පැයත් අතර ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂා කළ හැකිය.

**සභාපති,**
**කැබිනට් මණ්ඩලය විසින් පත්කරනලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

**දු.ක. 011-2390719**

**ෆැක්ස් : 011-2390720**

05. අදාළ වේ නම් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලංසු සමග ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන ලෙසට ලංසුකරුවන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.

06. පහත ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ආරක්ෂක අමාත්‍යාංශය වෙත ශ්‍රී ලංකා රු. 65,000.00 ක (හැටපන්දහසක) ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අභිලාෂී ලංසුකරුවන්හට සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබාගත හැකිය.

**ප්‍රධාන මූල්‍ය නිලධාරී (1),**
**ප්‍රසම්පාදන ශාඛාව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

**විද්‍යුත් තැපෑල : procurement@defence.lk**

07. ලංසු 2021.12.29 වන දින තෙක් වලංගු විය යුතුය.

08. ඉහත කරුණුවලට අමතරව ලංසු විවෘත කරන දිනයේදී ලංසුකරු විසින් ධාවන / ක්‍රීඩා පාවහන් යුගල (8 ප්‍රමාණය) 12 ක් ලංසුකරු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

09. MOD/SLA/01/2021 යොමු අංකය සටහන් කොට 2021.08.31 දින 1.00 පැයට හෝ ඉන් පෙර පහත ලිපිනය වෙත ලංසු භාරදිය යුතුය.

**ප්‍රධාන මූල්‍ය නිලධාරී (1),**
**ප්‍රසම්පාදන ශාඛාව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම මෙම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

10. 2021.08.17 වන දින 10.30 පැයට පහත ලිපිනයේදී පෙර ලංසු රැස්වීමක් පැවැත්වේ.

**යුධ හමුදා සෙලින්කෝ ගොඩනැගිල්ල,**
**නො. 167/10, අවිස්සාවේල්ල පාර,**
**ඕරුගොඩවත්ත.**

11. සෑම ලංසුවක් සමගම ලංසු ආරාධනයේ 20 වන වගන්තිය පරිදි ශ්‍රී ලංකා රුපියල් හයලක්ෂ හැට දෙදහස් එකසියයක (ශ්‍රී ලංකා රු. 662,100.00) ලංසු බැඳුම්කරයක් (ලංසු බැඳුම්කරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් වෙතින් ලබාගත් කොන්දේසි විරහිත ඉල්ලූවිට ගෙවන එකක් විය යුතුය)

12. විමසීම් විස්තර :

**යුද්ධෝපකරණ මාස්ටර් ජනරාල් ශාඛාව,**
**ශ්‍රී ලංකා යුධ හමුදාව,**

**දු.ක. 0094-11-2432135**
**ෆැක්ස් : 011-2432135**
**ඊමේල් : mgobranchemail@gmail.com**

**ප්‍රධාන මූල්‍ය නිලධාරී (1),**
**ප්‍රසම්පාදන ශාඛාව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.**

**දු.ක. : 0094-11-2390719**
**ෆැක්ස් : 0094-11-2390720**

13. ලංසු විවෘත කිරීමට අවම වශයෙන් දින තුනකට (03) පෙර ලංසු විවෘත කිරීමට සහභාගිවන අයවළුන්ගේ නම් සහ ජාතික හැඳුනුම් / ගමන් බලපත් අංක ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී I වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**සභාපති,**
**කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,**
**ශ්‍රී ලංකාව.**